# පළමු වන විජයබාහු රජු

- කුඩා කළ ඔහුව හැඳින්වූයේ **කිත්ති** යන නමිනි.
- කුමරුගේ පියා මහාසාමි මොග්ගල්ලානයි.
- මව ලෝකිතා දේවියයි.

**රජු ගැන හැදෑරීමට වැදගත් වන මූලාශ්‍ර කිහිපයකි.**

**(මහාවංශය, පනාකඩුව තඹ සන්නස, අඹගමුව ශිලා ලිපිය)**

- විජයබාහු රජුට කුඩා කළ සිට උදව් උපකාර කළ ප්‍රභූවරයා වූයේ **සිත් නරුබීන් බුදල්නා හෙවත් බුද්ධරාජයි.** කුමරුට රුහුණේ බලය ලබා ගැනීමට උදව් කළේද ඔහුය.
- කුඩා කළ සිටම සතුරන්ගෙන් රට නිදහස් කර ගැනීමේ දැඩි අධිෂ්ඨානයෙන් රජු කටයුතු කළේය.
- බුද්ධරාජ සෙන්පතිගේ සේවය ගැන **පනාකඩුව තඹ සන්නසෙහි** සඳහන් වේ.
- කිත්ති කුමරු රුහුණේ පාලකයා වූ කේශධාතු කාශ්‍යප සමග සටන් කොට රුහුණේ බලය ලබා ගනිමින් **කතරගම** පාලන මධ්‍යස්ථානය කර ගෙන **පළමු වන විජයබාහු** නමින් රජ විය.
- 1070 වර්ෂයේදී චෝලයින් පරදා පොළොන්නරුවේ බලය අල්ලා ගැනීම වැදගත් සිදු වීමකි.
- විජයබාහු රජු වසර 40ක් පමණ ලංකාව පාලනය කරනු ලැබීය.
- රට යටත්ව පැවති චෝල බලයෙන් නිදහස් කර ගැනීම සිදු වූයේද මොහුගේ කාලයේදීය.
- ඈපා, මාපා තනතුරු ඇති කොට සාම්ප්‍රදායික පරිපාලන රටාව නැවත රට තුළ ඇති කිරීම ද මෙතුමාගේ පාලන කාලයේදී සිදු විය.



- ❖ වාරිමාර්ග ප්‍රතිසංස්කරණය කොට රට තුළ ආර්ථික සමෘද්ධියක් ඇති කිරීම ද මොහුගේ සේවාවන් අතර වැදගත්ය.
- ❖ අනුරාධපුරයේ රජ මාලිගාවක් තැනවීම විජයබාහු රජු කළ සිදු කෙරිණි.
- ❖ රජු විදේශ රාජ්‍යයන් සමග මිත්‍ර සබඳතා ඇති කර ගැනීම ද වැදගත්ය.

උදා:

- ➢ සහෝදරිය වූ මිත්තා කුමරිය පාණ්ඩ්‍ය කුමරෙකුට විවාහ කර දීම මගින් **පාණ්ඩ්‍ය රාජ්‍ය** සමග සබඳතා ඇති කර ගැනීම.
- ➢ විජයබාහු තිලෝක සුන්දරී නම් කාලිංග කුමාරිකාවක් විවාහ කර ගෙන **කාලිංග දේශය** සමග මිත්‍ර සබඳතා ඇති කර ගැනීම.
- ➢ දූත හුවමාරු හා තෑගි බෝග යවමින් **බටහිර චාලුක්‍ය රාජවංශ** සමග මිත්‍ර සබඳතා ඇති කර ගැනීම.
- ➢ **බුරුමය** සමග සබඳතා ඇති කර ගැනීම.

- ❖ ශ්‍රී පාදස්ථානයට යන මාර්ගය ප්‍රතිසංස්කරණය කොට එම ස්ථානයට ගම් බිම් පිදීම.
- ❖ අනුරාධපුර සහ රුහුණේ වෙහෙර විහාර ප්‍රතිසංස්කරණය කිරීම.

**රජුගේ චරිතයෙන් ගත හැකි ආදර්ශ**

- කළගුණ සැළකීම
- අවංක බව
- නොපසුබස්නා උත්සාහය
- දැඩි අධිෂ්ඨානය

එතුමාගේ ජීවිතයේ උසස් ගුණාංග අඹගමුව සෙල් ලිපියේ සඳහන්ව ඇත

පැවරුම

1. පළමුවන විජයබාහු රජු විසින් විදේශ සබඳතා පැවැත්වූ රාජ්‍යයන් 03 ක් නම් කරන්න

2. පළමුවන විජයබාහු රජුගේ කුඩා කළ නම කුමක්ද?

3. පළමුවන විජයබායු රජුගේ මව පියා නම් කරන්න

4. රජුට කුඩා කළ සිට උදව් උපකාර කළ සෙන්පතියා කවුද?

5. රජු වසර කීයක් පමණ මෙරට පාලනය ගෙන ගියේද?



**පනාකඩුව තඹ සන්නස**